# උක්ත අනුක්ත භේදය




✶ ඉහත වාක්‍යයේ ගොවියෝ යනු කර්තෘ පදය වේ. බඳිති යන ආඛ්‍යාත පදය හා බැඳෙන ඉන් කියැවෙන පදය උක්ත පදයයි.

උදා :- ගොවියෝ

✶ ක්‍රියාවට යටත් වන පදය කර්ම පදය වන අතර එය අනුක්ත වේ.

උදා :- ගවයන්

**වාක්‍යයක අවසාන ක්‍රියා පදයෙන් කියැවෙන පදය උක්ත පදයයි. එසේ නොවන්නේ අනුක්ත පදයයි.**

- දෙමාපියෝ **දරුවන්** සමග පාසලට යති.
- ගුරුවරු **ශිෂ්‍යයන්** අමතති.
- ඉංජිනේරුවෝ **සේවකයන්** රාජකාරීවල යොදති.

ඉහත වාක්‍යයේ දෙමාපියෝ, ගුරුවරු, ඉංජිනේරුවෝ උක්ත පද වන අතර දරුවන්, ශිෂ්‍යයන්, සේවකයන් අනුක්ත පද වේ.

➢ **උක්ත හා අනුක්ත පද භේදය පෙන්වන ආකාර කිහිපයකි.**

**සචේතන නාම පද**

| ඒක වචන | | බහු වචන | |
|---|---|---|---|
| උක්ත පද | අනුක්ත පද | උක්ත පද | අනුක්ත පද |
| මිනිසා | මිනිසා | මිනිස්සු | මිනිසුන් |
| ගුරුවරයා | ගුරුවරයා | ගුරුවරු | ගුරුවරුන් |
| බල්ලා | බල්ලා | බල්ලෝ | බල්ලන් |
| කාන්තාව | කාන්තාව | කාන්තාවෝ | කාන්තාවන් |
| කම්කරුවා | කම්කරුවා | කුමාරතුංගයෝ | කුමාරතුංගයන් |
| සිංහයා | සිංහයා | ගුරුඑගෝමීහු | ගුරුඑගෝමීන් |

## සචේතන අනියමාර්ථ නාම පද

| උක්ත පද | අනුක්ත පද |
| --- | --- |
| මිනිසෙක් | මිනිසකු/ මිනිසෙකු |
| ළමයෙක් | ළමයකු/ ළමයෙකු |
| කාන්තාවක් | කාන්තාවක |
| දැරියක් | දැරියක |
| බල්ලෙක් | බල්ලකු/ බල්ලෙකු |

## සචේතන සර්ව නාම පදවල පුරුෂ භේදය අනුව උක්තානුක්ත පද

| රූපය | උක්ත පද | අනුක්ත පද |
| --- | --- | --- |
| **උත්තම පුරුෂ** | මම<br>අපි | මා<br>අප |
| **මධ්‍යම පුරුෂ** | තෝ<br>ඔබ<br>නුඹ / නුඹලා | තා<br>ඔබ<br>නුඹ / නුඹලා |
| **ප්‍රථම පුරුෂ** | ඔහු<br>ඔවුහු<br>හේ/ හෙතෙම<br>ඕ/ ඈ/ ඇය | ඔහු<br>ඔවුන්<br>ඔහු<br>ඇය |

## අචේතන නාම පද

| උක්ත පද | අනුක්ත පද |
| --- | --- |
| ගංගාව | ගංගාව |
| ගංගා | ගංගා |
| රීතිය | රීතිය |
| රීති | රීති |

## අචේතන අනියමාර්ථ පද

| උක්ත පද | අනුක්ත පද |
| --- | --- |
| ගංගාවක් | ගංගාවක් |
| රීතියක් | රීතියක් |

## සචේතන රූප ගැන්වූ නාම පද

| උක්ත පද | අනුක්ත පද |
| --- | --- |
| ගංගාවෝ | ගංගාවන් |
| රීතීහු | රීතීන් |
| වාක්‍යයෝ | වාක්‍යයන් |

## ලිඛිත අභ්‍යාස

1. නිවැරදි ව උක්ත අනුක්ත පද යොදා පහත වගුව සම්පූර්ණ කරන්න.

| උක්ත පද | අනුක්ත පද |
|---|---|
| දරුවෝ | |
| මිනිස්සු | |
| | ගැහැනුන් |
| ගුරුවරු | |
| කුරුල්ලෝ | |
| | ඇතුන් |
| | ලේඛකයන් |
| කොල්ලෝ | |
| ශිෂ්‍යයෝ | |
| ගවයෝ | |
| | කම්කරුවන් |
| | උගතුන් |

2. පහත වාක්‍යවල උක්ත පද යටින් ඉරක් අඳින්න.

i. මිනිස්සු ගෙවල් සාදති.

ii. කාන්තාවෝ දරුවන් නළවති.

iii. ළමයි සෙල්ලම් කරති.

iv. ගුරුවරු සිසුන්ට උගන්වති.

v. කාන්තාවක් මල් නෙළයි.

vi. මම පන්සල් යමි.

vii. ඔවුහු පොත් කියවති.

viii. තාරකාවෝ අහසේ බබළති.

3. පහත දැක්වෙන වාක්‍යවල හිස්තැන් පිරවීමට යෙදිය හැකි නිවැරදි පදය වරහන් තුළින් තෝරන්න.

I. මම හොඳින් ඉගෙන ........................... (ගනිමි/ගත්තෝ ය).

II. (සිසුහු/සිසුන්) ............ ගුරුතුමාට ආචාර කළහ.

III. (කාන්තාවක්/කාන්තාවක) .................... රිය අනතුරකට භාජනය වූවා ය.

IV. (දැරියක්/දැරියක) ................. මල් කඩන්නී ය.

V. ගංගාව වේගයෙන් ගලා ............ (බසියි/බසිති).

VI. ගුරුවරු ...................... (අපට/අපිට) අවවාද දෙති.

VII. ඒ තෙමේ දක්ෂ ලෙස .................... (නටයි/නටති).

VIII. ඔවුහු රටට සේවය ............... (කළහ/කරයි).

IX. ළමයෙක් උදෑසන පාසලට ......................... (එයි/එති).

X. මිනිස්සු ................. (ගවයන්/ගවයෝ) කුඹුරට දක්කති.